# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/223/2020 (NPC)

කස්තුරි බඩල්ගේ වසන්ත
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2025.09.10**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

**පෙනී සිටීම :-** අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක, මාලා බස්නායක මහත්මිය.

**-නියෝගය-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

කස්තුරි බඩල්ගේ වසන්ත යන අය විසින්, 2020.12.14 දිනැතිව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනයෙහි සඳහන් ව ඇත්තේ, ඔහු 2010.03.08 වෙනි දින පොලිස් පරීක්ෂක තනතුරෙහි උසස්වීම ලද බවයි. අනතුරුව එහි සඳහන් කර ඇත්තේ, 2017.11.14 දින දරණ චෝදනා පත්‍රය, ඔහු වෙත ඉදිරිපත් කරන ලද බවත්, එහි සඳහන්ව ඇති අපකීර්තිදායක හැසිරීම, අණට අකීකරුවීම, රාජකාරිය පැහැර හැරීම, සහ බොරුකීම හෝ ඇත්ත සඟවා කතා කිරීම, යන චෝදනා මත පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, එකී චෝදනා 04 අතුරින් චෝදනා 03 කට අභියාචක වරදකරු කරන ලද බවයි. අභියාචක වරදකරු බවට පත්කරන ලද චෝදනා සම්බන්ධයෙන් පනවන ලද දඬුවමට අනුව ඔහු

පොලිස් පරීක්ෂක තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුරට පහළ දමා ඇති බවද ඔහු විසින් සඳහන් කර ඇත. එකී විනය නියෝගය නිකුත් කර ඇත්තේ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ 2018.10.05 දිනැති ලිපිය මගිනි. එම ලේඛනය පැ.5 ලෙස අභියාචනා පෙත්සම සමග ඉදිරිපත් කර ඇත. එම විනය නියෝගයේ සඳහන් වන්නේ, අභියාචක පොලිස් පරීක්ෂක තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුර දක්වා පහළ දැමීමට තීරණය කර ඇති බවයි. ඒ සමගම වැඩ තහනම් කාලපරිච්ඡේදයක් වේනම්, ඒ සඳහා වැටුප් නොගෙවීමටද එයින් නියෝග කර ඇත.

එකී විනය නියෝගයට එරෙහිව අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, 2020.10.26 දිනැති ලිපිය මගින් අභියාචකගේ අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත.

අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමෙන් ඉල්ලා ඇත්තේ, ඔහුට සිදුව ඇති අසාධාරණය සම්බන්ධයෙන් සහනයක් ලබාදෙන ලෙසයි. කෙසේ නමුත් කරුණු විමසීමට ගැනීමෙන් අනතුරුව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන වල සඳහන් කර ඇත්තේ, අභියාචක වෙත පනවා ඇති දඬුවම ඉවත් කරමින් නියෝගයක් නිකුත් කරන ලෙසයි. ඒ අනුව ඔහුගේ ඉල්ලීම සළකා බැලීම සඳහා ඉදිරිපත් ව ඇති සියළුම කරුණු පරීක්ෂා කර බලමි.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමෙහි, විශේෂයෙන්ම එහි 06 වන ජේදයෙහි සඳහන් කර ඇත්තේ, චෝදනා පත්‍රයේ සඳහන්ව තිබූ දූෂිත ක්‍රියා මොනවාද යන්න, ඔහුට වරද කියා දෙන අවස්ථාවේ දී පැහැදිලි නොකළ බවයි. නමුත් එම ක්‍රියා මොනවාද යන්න ඉදිරිපත් කර ඇති චෝදනා වල පැහැදිලිව සඳහන් වේ. ඒ අතරම එම චෝදනා සම්බන්ධයෙන්, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීමේ දි හොඳ අවබෝධයකින් යුක්තව, අභියාචක වෙනුවෙන් සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ද අසා ඇත. එකී චෝදනා මොනවාද යන්න හොඳ අවබෝධයකින් යුක්තව, හරස් ප්‍රශ්න අසමින් විධිමත් විනය පරීක්ෂණයට අභියාචක විසින් මුහුණ දී ඇත. එබැවින් ඉදිරිපත් කර ඇති චෝදනා කියවා නොදීම තුළින්, අභියාචක නොමග ගිය බවක් තීරණය කළ නොහැක. ඒ අනුව චෝදනා

කියවා නුදුන්නේ යැයි ඉදිරිපත් කරන කරුණු මේ අවස්ථාවේ දි සළකා බැලිය නොහැකිය.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා මොනවාද යන්න, 2017.11.14 වෙනි දිනැතිව, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇති චෝදනා පත්‍රයේ සඳහන් වේ. එය පැ.1 ලෙසට අභියාචක විසින් ඔහුගේ අභියාචන පෙත්සම සමඟ ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් කර ඇති චෝදනා හතරටම මුල්වී ඇත්තේ, අභියාචක කළුතර දකුණ පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරමින් සිටියදී, 2015.01.08 වන දින පැවති ජනාධිපතිවරණය වෙනුවෙන් මැතිවරණ රාජකාරියේ යෙදී සිටි සියලුම පොලිස් නිලධාරීන්ගේ සුභ සාධන කටයුතු භාර භාර පොලිස් නිලධාරියා වශයෙන් කටයුතු කරමින්, මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් පොලිස් නිලධාරීන්ගේ සුභ සාධනය වෙනුවෙන් ලබාදුන් මි.ලී.500 වතුර බෝතල් 95ක් කළුතර නාගොඩ රෝහල ඉදිරිපිට ඇති නැෂනල් හෝටලය වෙත ලබාදීමයි.

එම චෝදනා සනාථ කිරීම සඳහා පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂිකරුවන් 12 දෙනෙකුගේ සාක්ෂි සටහන් කර ඇත. ප්‍රථමයෙන්ම සාක්ෂි දී ඇති ලක්ෂමන් රණවීර නැමැති සාක්ෂිකරු සඳහන් කර ඇත්තේ, 2015.01.10 වෙනි දින ලද දුරකථන ඇමතුමකින් අනතුරුව, ඔහු තවත් පොලිස් නිලධාරීන් ද කැටුව, නාගොඩ රෝහල ඉදිරිපිට ඇති හෝටලයට ගොස්, මිලි ලීටර් 500ක් අඩංගු වතුර බෝතල් 24 බැගින් අඩංගු පැකට් 03ක්ද, බෝතල් 23ක් අඩංගු පැකට් එකක්ද ඇතුළත් වතුර බෝතල් 95 පොලිස් භාරයට ගෙන, පොලිස් ස්ථානයට පැමිණි බවයි. ඒ අනුව සම්පූර්ණ වතුර බෝතල 95ක් පොලිස් භාරයට ගත් බව පැහැදිලිව ඔහු විසින් ප්‍රකාශ කර ඇත. එම සාක්ෂි හරස් ප්‍රශ්න වලට භාජනය වි නොමැත.

ලොකු විතානගේ සිරිසෝම නැමැති සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, මැතිවරණ රාජකාරී සඳහා යොදවා තිබූ පොලිස් නිලධාරීන් සඳහා ලබා දෙන ලද ජල බෝතල් සහ අනිකුත් ද්‍රව්‍ය අභියාචකට ලබාදුන් බවත්, ඒවායේ "මැතිවරණ රාජකාරී සඳහා පමණයි" යනුවෙන් සඳහන්ව තිබූ බවත්ය. එම සාක්ෂි වලින් පැහැදිලි වන්නේ, ලක්ෂමන් රණවීර යන අයගේ මග පෙනීම මත පොලිස් භාරයට ගෙන ඇති වතුර බෝතල් 95 නිකුත් කර ඇත්තේ, මැතිවරණ රාජකාරී වල නියුතු නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා බවයි.

ලක්කේෂ්වර චන්ද්‍ර නැමැති සාක්ෂිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, 2015.01.09 වෙනි දින ඔහු සේවය කළ නැෂනල් හෝටලය වෙත පොලිස් නිලධාරියෙකු පැමිණ වතුර බෝතල් 95 ක් ඔහු වෙත ලබාදුන් බවයි. එම පොලිස් නිලධාරියා එම වෙළඳ සැලේ හිමිකරු හඳුනන බව එම පැවසූ බවට, ඔහු වැඩිදුරත් ප්‍රකාශ කර ඇත. ඉන් අනතුරුව ඔහු ප්‍රකාශ කර ඇත්තේ ඊට පසු දින එනම්, 2015.01.10 වෙනි දින කළුතර පොලිසියේ නිලධාරීන් පැමිණ එම වතුර බෝතල් 95 සමග ඔහු ද කළුතර පොලිසියට රැගෙන ගිය බවයි.

මෙම සාක්ෂි වලින් පැහැදිලිව පෙනී යන්නේ අභියාචක විසින් ඉහත කී මැතිවරණ රාජකාරිය සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ ප්‍රයෝජනයට නිකුත් කර තිබූ වතුර බෝතල් 95 පද්මකුමාර සිරිවර්ධන නැමැති සාක්ෂිකරුට අයත් නැෂනල් හෝටලය වෙත 2015.01.09 වෙනි දින ගෙනවිත් දී ඇති බවයි. එම සියළුම වතුර බෝතල් ඊට පසු දින එනම් 2015.01.10 වෙනි දින පොලිස් භාරයට ගෙන ඇති බවත් පැහැදිලි වේ. මෙම සාක්ෂි මගින් ඉතා හොඳින් පැහැදිලි වන්නේ, අභියාචක විසින් ගෙනවිත් දුන් වතුර බෝතල් 95 ඒ ආකාරයෙන්ම ඊට පසු දින ආපසු පොලිස් භාරයට ලබාගෙන ඇති බවයි. එම තත්ත්වය යටතේ, එම වතුර බෝතල් විකුණා තිබූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවේ.

විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාවෙහි, පරීක්ෂණයේ දී සොයාගත් කරුණු යටතේ ඔහු සඳහන් කර ඇත්තේ;

> "**චූදිත නිලධාරියා විසින් මෙම ජලබෝතල් මෙම වෙළඳ සැලේ 2015.01.09 වෙනි දින තැබූ බවට අනාවරණය වී ඇති අතර ...**
> **2015.01.10 වන දින දක්වා එම ජල බෝතල් මෙම වෙළෙඳ සැලේම තැබීමට සැලැස්වීමෙන් නිලධාරියා විසින් යම් අක්‍රමිකතාවයක් සිදුකිරීමේ චේතනාවක් තිබී ඇති බවට නිගමනය කරමි.**" යනුවෙනි.

විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ වාර්තාවේ සඳහන් ඉහත කී නිගමනයෙන් පෙනී යන්නේ, අභියාචක විසින් වතුර බෝතල් 95 වෙළඳසැළක දිනයක් තුළ තබා ගැනීමට සැළැස්වීම වැරදි සහගත ක්‍රියාවක් බවයි. එය නිවැරදි තීරණයක් බව පෙනී යයි.

කෙසේ වෙතත්, මෙම අවස්ථාවේ දි මෙහිදී ඉදිරිපත් වන වැදගත් ප්‍රශ්නයක් වන්නේ, අභියාචකට එරෙහිව පවත්වන ලදක විධිමත් විනය පරීක්ෂණයේ දී පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ලබා ගැනීමෙන් අනතුරුව, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් චූදිත අභියාචක සතු නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම් ඔහු වෙත නිවැරදිව පහදා දි තිබේද යන කරුණයි. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා, පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කර ගැනීමෙන් අනතුරුව පහත සඳහන් සටහන යොදා ඇත.

> **"අද දිනට කැඳවා සිටින වෙනත් සාක්ෂිකරුවන් කිසිවකු නොමැති අතර මෙම විධිමත් විනය පරීක්ෂණය සඳහා තවත් සාක්ෂිකරුවන් කැඳවන්නේ ද යන්න මෙහෙයුම් නිලධාරීගෙන් විමසා සිටිමි.**
>
> **වෙනත් සාක්ෂි පරීක්ෂණය සඳහා නොමැති බව දන්වා සිටින අතර මූලික විමර්ශන ගොනුව පැ.22 වශයෙන් ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටියි.**
>
> **අවසර ලබා දෙමි.**
>
> **මේ අවස්ථාවේ දී පැමිණිල්ල මෙහෙයවන නිලධාරී පො.ප.ඩබ්.ගුණතිලක මහතා විසින් මෙම විධිමත් විනය පරීක්ෂණය සඳහා සාක්ෂි ලබාදෙන ලද පැ/ස 01 සිට පැ/ස 12 දක්වා සාක්ෂි මෙහෙයවා අවසන් බැවින් ද පැ.1 සිට පැ.22 දක්වා ලේඛන ලකුණු කරමින් ද පැමිණිල්ලේ සාක්ෂි මෙහෙයවීම අවසන් බව දැනුම් දෙයි."**

ඉහත සටහන පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව පෙනී යන්නේ, පැමිණිල්ලේ සාක්ෂි සටහන් කර ගැනීමෙන් අනතුරුව, විත්තිකරුවෙකු සතු සාක්ෂි දීමේ අයිතිවාසිකම හෝ ඔහු සතු ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් නිසි පැහැදිලි කිරීමක් පරීක්ෂණ නිලධාරියා විසින් කර නොමැති බවයි. එම තත්ත්වය අභියාචක වෙත පැහැදිලි කර දුන්නේ නම්, ඉහත සඳහන් වතුර බෝතල එක් දිනයක් තුළ වෙළඳ සැලක තැබුවේ කුමන හේතුවක් නිසාද යන කරුණ ඉදිරිපත් කිරීමට අභියාචකට අවස්ථාව තිබුණි. මෙහිදී පෙනී යන්නේ අභියාචක සතුවූ එම අවස්ථාව ඔහු වෙත ලබා දෙමින්, පැහැදිලි කර දී නොමැති බවයි. එවැනි තත්ත්වයක් යටතේ වතුර බෝතල් මෙම ස්ථානයට ලබාදීම පමණින් ම, අභියාචක වැරදි චේතනාවකින් එය කර තිබුණේ ද යන්න පිළිබඳව පැහැදිලි තීරණයකට

එළඹිය නොහැක. එසේ නම් එම කරුණ සම්බන්ධයෙන් වන වාසිය අභියාචක වෙත හිමිවිය යුතුය.

කෙසේ වෙතත්, එවැනි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර නොතිබීම පමණක් සළකා අභියාචක සම්පූරණයෙන්ම නිදහස් කිරීමකට යටත් කළ නොහැක. නමුත් එවැනි තත්ත්වයක් යටතේ අභියාචකට පනවා ඇති දඩුවම ඉතාමත් බරපතල වනවා ඇත. විශේෂයෙන්ම අභියාචක විසින් පොලිස් පරීක්ෂ තනතුරේ වරප්‍රසාද ලබමින්, 2010.02.08 වෙනි දින සිට, විනය නියෝගය නිකුත් කර ඇති 2018.10.05 වෙනි දින දක්වා, කටයුතු කර ඇත. එය දීර්ඝ කාලපරිච්ජේදයකි. එවැනි තත්ත්වයක් යටතේ ඉදිරිපත් කර ඇති චෝදනා වලට පනවා ඇති දඩුවම ඉතාමත් බරපතල වනවා ඇත. එම කරුණු සළකා බලා 2018.10.05 දිනැති විනය නියෝගය මඟින් නිකුත් කර ඇති පළමු වන දඩුවම ඉවත් කිරීමට තීරණය කරමි. නිකුත් කර ඇති දෙවන දඩුවම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය යුතු බවට තීරණය කරමි.

ඉහත හේතුන් සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව ඉඩදෙමු.

මෙම නියෝගය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-